කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023

2025 අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

වෘත්තීය අභිමුඛ තොරතුරු තාක්ෂණය (නව නිර්දේශය)

CBIT 18213 Fundamentals of IT

වෘත්තීය අභිමුඛ තොරතුරු තාක්ෂණය **(CBIT 18213) - Part I** | කාලය : පැය 01 යි

උපදෙස්:

- සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4),(5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- බහුවරණ ප්‍රශ්නයක් සඳහා ලකුණු 1 ක් හිමි වේ. (1 Mark x 40 = 40 Marks)

---

1) පරිගණක දෘඩාංගයක් (Hardware) සඳහා උදාහරණයක් නොවන්නේ,
   (1) Keyboard
   (2) Printer
   (3) CD
   (4) Operating System
   (5) Power Supply

2) තෙවන පරම්පරාවේ පරිගණක සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ/ය වන්නේ,
   (1) 1941 සිට 1964 දක්වා කාල පරාසය තුළ නිර්මාණය විය.
   (2) අනුකලිත පරිපථ (Integrated Circuit) ප්‍රධාන තාක්ෂණය විය.
   (3) දත්ත ආදානය, සුරැකීම සහ ප්‍රතිදානය සඳහා සිදුරුපත් (Punch Cards) භාවිතා විය.
   (4) වැඩසටහන් ලිවීම සඳහා එසෙම්බ්ලි භාෂාවන්(Assembly Level languages) භාවිතා විය.
   (5) ඉහත ප්‍රකාශ සියල්ල නිවැරදි වේ.

3) චිත්‍රක අතුරුමුහුණත(Graphical User Interface) භාවිතය ආරම්භ වුයේ කුමන පරිගණක පරම්පරාවේද?
   (1) පළමු පරම්පරාව(First Generation)
   (2) දෙවන පරම්පරාව(Second Generation)
   (3) තුන්වන පරම්පරාව(Third Generation)
   (4) හතරවන පරම්පරාව(Fourth Generation)
   (5) පස්වන පරම්පරාව(Fifth Generation)

4) පරිගණකයේ ගොනුවක(File) විශාලත්වය මනින කුඩාම ඒකකය වන්නේ,

(1) Byte
(2) Nibble
(3) Bit
(4) Word
(5) Kilobyte

5) ආචායන උපාංගවල(Storage Devices) දත්ත ප්‍රවේශ වේගයෙහි (Data Access speed) ආරෝහණ පිළිවෙල වන්නේ,

(1) Register, Cache, RAM, Hard Disk
(2) Cache, Hard Disk, RAM, CD
(3) RAM, Hard Disk , RAM, Cache , Register
(4) Register, DVD, CD, Flash Disk
(5) Magnetic Tape, Hard Disk , RAM, Cache

6) 6GB ප්‍රමාණයේ යුතු සැනෙලි මතකය (Pen Drive) තුළ 4GB ප්‍රමාණයක් දැනට භාවිතා වි ඇත. එහි ඉතිරි ඉඩ උපරිම වශයෙන් භාවිතා වන පරිදි පහත දක්වා ඇති ගොනු අතුරින් කුමන ගොනු ආචයනය (Store) කළ හැකි වන්නේද?

File Name	Size
X. ppt	1020 MB
Y. avi	600 MB
Z. png	2048 KB
Q. mp4	1 GB

(1) X හා Y
(2) Q හා X
(3) Q, X හා Y
(4) Q,X හා Z
(5) Q,X,Y හා Z

7) නශ්‍ය නොවන (Non-Volatile) මතකය/ක් වන්නේ,

(1) RAM
(2) Cache
(3) Register
(4) ROM
(5) ඉහත පිළිතුරු සියල්ල නිවැරදි වේ.

8) සංඝට්ටන මුද්‍රණ යන්ත්‍ර (Impact Printer) වල ලක්ෂණයක් නොවන්නේ,

(1) මුද්‍රණය සඳහා යන වියදම ඉතා අඩු වේ.
(2) තීන්ත විදුම් මුද්‍රණ යන්ත්‍රය (Bubble Printer/Ink Jet) මෙම වර්ගයට අයත් වේ.
(3) මුද්‍රණයේ හිස (Print Head) කඩදාසිය මත ගැටීම තුළින් මුද්‍රණය වේ.
(4) අඩු මුද්‍රණ වේගයක් ඇත.
(5) ක්‍රියාත්මක වීමේ දී ඝෝෂාකාරී වේ.

9) පහත A ,B හා C මගින් දැක්වෙන පරිගණක දෘඩාංග(Hardware) පිළිවෙලින් සඳහන් වන්නේ,

A

B

C

(1) A- Light Pen	B- Battery	C- CRT Monitor
(2) A- OCR	B- Power Supply	C- LCD Monitor
(3) A- OMR	B -Power Supply	C- LED Monitor
(4) A- OCR	B -Cooling Fan	C- LCD Monitor
(5) A -Light Pen	B -Power Supply	C - LED Monitor

10) යතුරු පුවරුව තුළ අඩංගු කාර්යය යතුරු(Function Key) ප්‍රමාණය වන්නේ,

(1) 8
(2) 4
(3) 12
(4) 16
(5) 20

11) Optical Mark Recognition (OMR) උපාංගය භාවිතා කරනුයේ,

(1) අතින් ලියන ලද රචනා සුපිරික්සනය(Scan) කිරීමට.
(2) තීරු කේත කියවීමට.
(3) සහතික මුද්‍රණය කිරීමට.
(4) බහුවරණ වල පිළිතුරු පත්‍ර පරීක්ෂාවට.
(5) ඩිජිටල් ඡායාරූප ගබඩා කිරීමට.

12) පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

A. LCD හා LED සංදර්ශකවල(Monitor) තිරය පැතලි ප්‍රදර්ශක(Flat Screen) තාක්ෂණයට අනුව නිපදවා ඇත.

B. LCD සංදර්ශක, LED සංදර්ශකවලට(Monitor) වඩා වැඩි විදුලි පරිභෝජනයකින් යුක්ත වේ.

C. සංදර්ශකයේ ප්‍රමාණය(Monitor Size) ගණනය කෙරෙන්නේ විකර්ණය ඔස්සේ පවතින දිග ප්‍රමාණය අඟල් වලිනි.

(1) A පමණි.
(2) C පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A,B හා C සියල්ලම.

13) M.2 SSD සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) පරිගණකයේ ක්‍රියාකාරී වේගය වැඩිකර ගැනීමට භාවිතාවේ.
(2) ඍජුවම(Direct) මව් පුවරුවට(Motherboard) සම්බන්ධ කිරීමේ හැකියාවක් පවතී.
(3) දෘඪ තැටියට (Hard Disk) වඩා දත්ත ප්‍රවේශ වේගය (Data Access speed) වැඩි වේ.
(4) අඩු විදුලි පරිභෝජනයක් පවතී.
(5) බිටු(Bit) එකක් සඳහා වැය වන මුදල සඳහා වඩා අඩු වියදමක් දැරීමට සිදු වේ.

14) North Bridge සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) 'CPU' හා 'RAM' වල තොරතුරු හුවමාරු කිරීම කළමනාකරණය කරයි.
(2) 'CPU' සමග සෘජුවම(Direct) සම්බන්ධ වීමේ හැකියාවක් පවතී.
(3) 'South Bridge' වලට වඩා සන්නිවේදනය වේගවත් වේ.
(4) ආදාන උපාංග(Input Devices) හා ප්‍රතිදාන උපාංග(Output Devices) පාලනය සිදුකරයි.
(5) එය මව්පුවරුවේ (Motherboard) පිහිටා ඇත.

15) 'HDMI' කෙවෙනි (Port) හරහා සම්බන්ධ වන උපාංග/යක් වන්නේ,

A. Smart TV
B. CRT Monitor
C. Multimedia Projector

(1) B පමණි.
(2) C පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A,B හා C සියල්ලම.

16) 'Peripheral Component Interconnect' (PCI) slot හරහා පරිගණකයට සම්බන්ධවන උපාංගයක් වන්නේ,

(1) USB Flash Driver
(2) Sound Card
(3) VGA Card
(4) SSD
(5) LED Monitor

17) 'Machine Cycle' හි පියවර හතර පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) Store, Fetch, Decode, Execute
(2) Fetch, Store, Decode, Execute
(3) Decode, Fetch, Execute, Store
(4) Fetch, Decode, Execute, Store
(5) Decode, Execute, Store, Fetch

18) සකසන (Processors) නිෂ්පාදනය කරන සමාගමක් නොවන්නේ,

(1) Intel
(2) AMD
(3) Apple
(4) Microsoft
(5) NVIDIA

19) වාරක මතක (Cache Memory) වන L_1,L_2 හා L_3 මතකවල විශාලත්වය අනුව නිවැරදිව දැක්වෙන්නේ,

(1) $L_1 < L_2 < L_3$
(2) $L_1 < L_3 < L_2$
(3) $L_3 < L_2 < L_1$
(4) $L_2 < L_1 < L_3$
(5) $L_3 < L_1 < L_2$

20) පහත සඳහන් මෘදුකාංග අතුරින්, යෙදුම් මෘදුකාංගයක් (Application Software) වන්නේ,

(1) Computer Game
(2) BIOS
(3) Compiler
(4) Microsoft Windows
(5) MacOS

21) 'Device Drivers' සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) භෞතික දෘඩාංග සංරචකයකි (Physical Hardware Component).
(2) ඉහළ මට්ටමේ ක්‍රමලේඛන භාෂා (High-Level Programming Languages) පරිවර්තනය කරයි.
(3) මෙහෙයුම් පද්ධතියට දෘඩාංග(Hardware) සමඟ සන්නිවේදනය කිරීමට ඉඩ සලසන විශේෂ මෘදුකාංග(Software) වර්ගයකි.
(4) පරිශීලක ගොනු සහ ලේඛන ගබඩා කරයි.
(5) රූප සංස්කරණය (Image Editing) කිරීම සඳහා භාවිතා කරන යෙදුම් මෘදුකාංගයකි (Application Software).

22) ගොනුවක නාමය සඳහා අන්තර්ගත කළ නොහැකි සංකේතය වන්නේ,

(1) A
(2) [
(3) /
(4) @
(5) +

23) පරිගණක පද්ධතියට වෛරසයක් ඇතුලු වීම නිසා ඇතිවිය හැකි අනිසි ප්‍රතිඵලයක් වීමට නොහැක්කේ පහත කවරක්ද?

(1) පරිගණකයේ දත්ත හා තොරතුරු වෙනස් වීම (Modify).
(2) පරිගණකයේ දෘඩාංග(Hardware) විනාශ වීම.
(3) පරිගණකයේ ක්‍රියාකාරී කාර්යක්ෂමතාව අඩුවීම.
(4) පරිගණකයේ ජාල(Computer Network) සබඳතාව බිඳවැටීම.
(5) පරිගණකයේ දත්ත හා තොරතුරු සැඟවීම(Hide).

24) ඉහළ තලයේ භාෂාවක් (High level languages) සඳහා උදාහරණයක් නොවන්නේ,

(1) Java
(2) C#
(3) C++
(4) Python
(5) Assembly

25) උපයෝගිතා මෘදුකාංග /යක් (Utility Software) නොවන්නේ,

(1) Antivirus Software
(2) Disk Defragmentation
(3) Disk Cleanup
(4) ස්ථිරාංග(Firmware)
(5) Backup Software

26) වදන් සැකසුම් මෘදුකාංගයක් (Word Processing Software) සඳහා උදාහරණ/යක් නොවන්නේ,

(1) Microsoft PowerPoint
(2) iWork Page
(3) OpenOffice Write
(4) LibreOffice Writer
(5) ඉහත පිළිතුරු සියල්ලම

27) 'Microsoft Word' හි 'Table of Content' මෙවලම(Tool) අන්තර්ගතව ඇත්තේ,

(1) Home Tab තුළය.
(2) Insert Tab තුළය.
(3) Design Tab තුළය.
(4) Layout Tab තුළය.
(5) Reference Tab තුළය.

28) පහත රූපයේ දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංග තුළ අන්තර්ගත මෙවලමකි. මෙම මෙවලම හඳුන්වන නම වන්නේ,



(1) WordArt Tool
(2) Font Color Tool
(3) Background Color Tool
(4) Painter Tool
(5) Drop Cap Tool

29) 'Task Manager' ලබාගැනීමට යොදා ගත හැකි 'Shortcut Key' එක වන්නේ,
(1) Ctrl + Alt + T
(2) Alt + Shift + Esc
(3) Ctrl + Shift + T
(4) Ctrl + Shift + Esc
(5) Alt + Ctrl + Delete + T

30) 'Firewall' සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ/ය වන්නේ,
(1) දෘඩාංගයක්(hardware) ලෙස පමණක් පවතී.
(2) එය පුද්ගලික ජාලයකට වන අනවසර ප්‍රවේශ(Unauthorized Access) වළක්වයි.
(3) 'Back Up' ගොනු ආරක්ෂිතව ගබඩා(Store) කිරීම සඳහා 'Firewall' භාවිතා කරයි.
(4) එය පරිගණකයකට ඇතුලු වී ඇති වෛරස් ස්වයංක්‍රියව මකා දමයි.
(5) ඉහත පිළිතුරු සියල්ලම නිවැරදි වේ

31) 'Access Point' (AP)හි කාර්යක් වන්නේ,
(1) පරිශීලකයින් සඳහා දත්ත ගබඩා කිරීම.
(2) රැහැන් සහිත උපාංග(Wired Devices) සඳහා පමණක් අන්තර්ජාල ප්‍රවේශය ලබාදීම.
(3) රැහැන් රහිත උපාංග(Wireless Devices) රැහැන්ගත ජාලයකට(Wired Network) සම්බන්ධ කිරීම.
(4) වෙබ් අඩවි සඳහා වන අනවසර පිවිසීම් වළක්වයි.
(5) අන්තර්ජාලයේ ඇති සියලුම පරිශීලක දත්ත ගුප්තකේතකරනය (Encrypt) කිරීමට.

32) චන්ද්‍රිකා (Satellite) තාක්ෂණය මගින් සන්නිවේදනය කිරීම සඳහා යොදාගනු ලබන තරංගය වන්නේ,
(1) රේඩියෝ තරංග (Radio Wave)
(2) ක්ෂුද්‍ර තරංග (Microwave)
(3) WIFI තරංග
(4) අධෝරක්ත තරංග (Infrared Wave)
(5) Bluetooth තරංග

33) මෑත කාලයේ ශ්‍රී ලංකාවේ දියත් කරන ලද නව චන්ද්‍රිකා පාදක අන්තර්ජාල පහසුකම කුමක්ද?
(1) Google Loon
(2) OneWeb
(3) Starlink
(4) SLT Fiber Ultra
(5) Microsoft Azure Space

34) දත්ත සන්නිවේදනය කිරීමට තඹ කම්බි (Copper Cable) වලට වඩා ප්‍රකාශ තන්තු (Fiber Optic) කේබල් හී ප්‍රධාන වාසි/ය වන්නේ,

A. මිළ අඩු වීම.
B. වැඩි දුරකට දත්ත සන්නිවේදනය.
C. වේගවත් දත්ත සන්නිවේදනය.

(1) A පමණි
(2) B පමණි
(3) A හා B පමණි
(4) B හා C පමණි
(5) A,B හා C සියල්ලම

35) දත්ත සන්නිවේදන පද්ධතියක මූලික ලක්ෂණ/ය වන්නේ,

A. බෙදා හැරීම (Deliver)
B. නිරවද්‍යතාව(Accuracy)
C. Timeliness

(1) B පමණි
(2) C පමණි
(3) A හා B පමණි
(4) B හා C පමණි
(5) A, B හා C සියල්ලම

36) Local Area Network (LAN) සම්බන්ධයෙන් වැරැදි ප්‍රකාශය වන්නේ,

(1) ගොඩනැගිල්ලක් හෝ විශ්ව විද්‍යාලයක් වැනි කුඩා භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කරයි.
(2) ඉහළ දත්ත හුවමාරු වේගයක් සපයයි.
(3) ගොනු(Files) සහ මුද්‍රණ යන්ත්‍ර වැනි සම්පත් බෙදා ගැනීමට ඉඩ සලසයි.
(4) සාමාන්‍යයෙන් තනි සංවිධානයක් විසින් කළමනාකරණය කරනු ලැබේ.
(5) ජාලය තුළ සම්ප්‍රේෂණ මාධ්‍ය(Transmission Media) ලෙස ප්‍රකාශ තන්තු(Fiber Optic) කේබල් පමණක් භාවිතා කරයි.

37) රූපයේ දැක්වෙන 'Network Topology' වන්නේ,



(1) Ring Topology
(2) Mesh Topology
(3) Bus Topology
(4) Star Topology
(5) Tree Topology

38) IPv4 හා IPv6 ලිපින (Address) සම්බන්ධයෙන් පහත ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,

A. 'IPv4' ලිපින (Address) බිටු (bit) 16 කින් සමන්විතයි.

B. 'IPv6' ලිපින (Address) බිටු 32 කින් සමන්විතයි.

C. 'IPv6' ලිපින (Address) ෂඩ්දශමය (Hexadecimal) සංඛ්‍යා භාවිතා කරයි.

(1) A පමණි.
(2) C පමණි.
(3) A හා C පමණි.
(4) A හා B පමණි.
(5) A, B හා C සියල්ලම.

39) 132.45.67.89 යන 'IP' ලිපිනය අයත් වන්නේ,

(1) Class A
(2) Class B
(3) Class C
(4) Class D
(5) Class E

40) 'Extranet' ජාලයක දක්නට ලැබෙන විශේෂාංගයක්(Features) **නොවන්නේ,**

(1) ආරක්ෂිත සන්නිවේදනය.
(2) වෙබ් බ්‍රවුසරය(Web Browser) හරහා පිවිසුමක් ඇත.
(3) ජාත්‍යන්තර ජාල(Network) සේවාවකි.
(4) අවසරලත් බාහිර පරිශීලකයින්ට ප්‍රවේශ විය හැක.
(5) පාලනය කළ හැකි පිවිසුම(Controlled Access).

වෘත්තීය අභිමුඛ තොරතුරු තාක්ෂණය (CBIT) - Part II

කාලය : පැය 02 යි

උපදෙස්:

✠ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
✠ සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

01)

a)

i. දත්ත (Data) හා තොරතුරු (Information) අතර වෙනස නිදසුනක් ගෙන පැහැදිලි කරන්න.

[2 Mark]

ii. වර්තමාන සමාජයේ තොරතුරු තාක්ෂණය භාවිතා කරන ක්ෂේත්‍ර(Fields) හතරක්(4) පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

[3 Mark]

b)

i. පස්වන පරම්පරාවේ පරිගණකවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හා එහි තාක්ෂණය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

[2 Mark]

ii. පහත සඳහන් දෘඩාංග(Hardware) කෙටියෙන් පැහැදිලි කරන්න.(එක් කොටසක් සම්බන්ධව අවම කරුණු තුනක් පැවතිය යුතුය.)

a) Optical Media Devices (ප්‍රකාශ මාධ්‍ය උපාංග)
b) Random Access Memory (RAM)

[3 Mark]
(Total Marks 10)

02)

a)

i. 'USB' කෙවැනි (Port) හරහා පරිගණකයට සම්බන්ධ වන උපාංග හතරක්(4) නම් කරන්න.

[2 Mark]

ii. පරිගණක පද්ධති බස්(Computer System Bus) වර්ග තුන නම්කර එහි කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.

[3 Mark]

b)

i. පරිගණකයක් මිලදී ගැනීමේ දී, ඔබ සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න

[2 Mark]

ii. මධ්‍ය සැකසුම් ඒකකයේ(CPU) පවතින පහත කොටස් කෙටියෙන් පැහැදිලි කරන්න.

a) පාලන ඒකකය(Control Unit)
b) රෙජිස්ටර් මතකය (Register Memory)

[3 Mark]
(Total Marks 10)

03)

a)

i. විවෘත මූලාශ්‍ර(Open Source) මෙහෙයුම් පද්ධතියක්(Operating System) හා විවෘත මූලාශ්‍ර(Open Source) යෙදුම් මෘදුකාංගයක් (Application Software) නම් කරන්න.

[1 Mark]

ii. මෙහෙයුම් පද්ධතියක් (Operating System) මගින් සිදුකරන කාර්යයන් හතරක්(4) ලියන්න.

[2 Mark]

iii. භාෂා පරිවර්ථක(Language Translator) තුන(3) සඳහන් කර එම භාෂා පරිවර්ථකවල කාර්යය සැකෙවින් පැහැදිලි කරන්න.

[3 Mark]

b)

i. වදන් සැකසුම් මෘදුකාංග (Word Processing Software) භාවිතා කිරීමෙන් ලැබෙන වාසි හතරක් (4) ලියන්න.

[2 Mark]

ii. පහත දැක්වෙන A අවස්ථාවේ ඇති හැඩය(Shape) B අවස්ථාවේ ඇති හැඩය(Shape) දක්වා හැඩසව් (formatting) කිරීම සඳහා 'Microsoft Word' භාවිතා කර ඇත. B අවස්ථාවේ ඇති හැඩය(Shape) හැඩසව් ගැන්වීම (Formatting) සඳහා යොදාගෙන ඇති මෙවලම් (Tool) හතරක්(4) ලියන්න.

A අවස්ථාව B අවස්ථාව

[2 Mark]

(Total Marks 10)

04)

a)

i. ජාල වින්‍යාසයක් වන 'Ring Topology' හි දළ සටහනක් ඇඳ, එහි ඇති වාසියක් හා අවාසියක් සඳහන් කරන්න. [2 Mark]

ii. පරිගණක ජාලයක් නිර්මාණය කිරීමේදී පහත දැක්වෙන උපාංගවල කාර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.
   a) Switch
   b) Router

[2 Mark]

b)

i. දත්ත සන්නිවේදන පද්ධතියක(Data Communication System) සංරචක(Components) හතරක්(4) නම් කරන්න.

[2 Mark]

ii. අර්ධ ද්විපථ (Half Duplex Mode) හි ක්‍රියාකාරීත්වය පැහැදිලි කර උදාහරණ දෙකක්(2) ක් ලියන්න.

[2 Mark]

iii. ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අන්තර්ජාල පහසුකම භාවිතා කල හැකි ආකාරය පැහැදිලි කරන්න. (අවම කරුණු 4ක් සඳහන් විය යුතුය.)

[2 Mark]

(Total Marks 10)

****************************End of the Paper****************************